දෙන ලද සරසුලක නොදන්නා සංඛ්‍යාතය ($f$) නිර්ණය කිරීම සඳහා ඔබට රූපයේ පෙන්වා ඇති පරිදි ධ්වනිමානයක් සහ එක් $M$ ස්කන්ධයක් සපයා ඇත. දෙන ලද ධ්වනිමානයේ $P$ හි දී විවර්තනය කරන ලද ලීවරයක බාහුවේ ඇති වෙනස් තව්වලින් දෙන ලද ස්කන්ධය එල්ලීමෙන් කම්බියේ ආතතිය වෙනස් කළ හැකි ය. රූපයේ දැක්වෙන ආකාරයට 1 සිට 5 දක්වා තව් අංකනය කර ඇති අතර 1, 2, 3, 4, සහ 5 තව්වලට $P$ සිට ඇති දුරවල් පිළිවෙළින් 1. 0, 2. 0, 3. 0, 4. 0, සහ 5.0 cm වේ. $P$ **සිට කම්බයට ඇති ලම්බක දුර ද** 1.0 cm **වේ**. ස්කන්ධය නිසා කම්බියේ සිදුවන දික්වීම නොසලකා හැරිය හැකි තරම් කුඩා ලෙස පවත්වා ගන්නේ යැයි උපකල්පනය කරන්න.




(*a*) දෙන ලද සරසුල සමඟ අනුනාද වන ධ්වනිමාන කම්බියේ මූලික අනුනාද දිග ( $l$ ) ඔබ පරීක්ෂණාත්මකව සොයා ගන්නේ කෙසේ ද ?

(*b*) $l$ සඳහා ප්‍රකාශනයක්, $f$ , කම්බියේ ආතතිය ($T$), සම කම්බියේ ඒකක දිගක ස්කන්ධය ($m$) ඇසුරෙන් ලියා දක්වන්න.

(*c*) එක් එක් තව්වෙන් $M$ ස්කන්ධය එල්ලා අනුරූප $l$ දිග මනිනු ලැබේ. $n$ වෙනි තව්වෙන් ( $n = 1, 2, 3, 4, 5$ ) ස්කන්ධය එල්ලූ විට කම්බියේ ආතතිය $T = Mgn$ මඟින් දෙනු ලැබේ. ඔබ මෙම සම්බන්ධතාවය ලබා ගන්නේ කෙසේ ද ?

(*d*) $Mg, m, f$ සහ $n$ ඇසුරෙන් $l^2$ සඳහා ප්‍රකාශනයක් ලබා ගන්න.

(*e*) සැලකිය යුතු දික්වීමක් ඇති නොවන ලෙස ධ්වනිමාන කම්බියට දැරිය හැකි උපරිම ආතතිය 54 N වේ. මිනුම් ගැනීමට තව් පහම භාවිත කිරීමට ඔබට ඉඩ සලස්වන $M$ සඳහා තිබිය හැකි උපරිම අගය ( kg වලින් ) කුමක් ද ?

---

---

(*f*) ධ්වනිමාන කම්බිය සාදා ඇති ද්‍රව්‍යයේ ඝනත්වය ඔබට සපයා ඇත. $m$ හි අගය නිර්ණය කිරීම සඳහා ඔබ ලබා ගත යුතු මිනුම, එම මිනුම ලබා ගැනීමට භාවිත කරන මිනුම් උපකරණයත් සමග ලියා දක්වන්න.

(i) ලබා ගත යුතු මිනුම : ____________________

(ii) උචිත මිනුම් උපකරණය : ____________________

(*g*) එවැනි පරීක්ෂණයක දී අඳින ලද $n$ එදිරියෙන් $l^2$ ප්‍රස්තාරයක් පහත දී ඇත.




(i) $f$ හි අගය නිර්ණය කිරීම සඳහා ප්‍රස්තාරයෙන් අවශ්‍ය වන රාශියේ සංඛ්‍යාත්මක අගය ලබා ගන්න.

---

---

---

(ii) $M = 0.5$ kg සහ $m = 2 \times 10^{-3}$ kg m$^{-1}$ නම් $f$ හි අගය ගණනය කරන්න.

---

---

---

---